EXAMRESULTS.LK



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

2019.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) දේශපාලන පක්ෂ මාරුවෙන් මාරුවට රට පාලනය කිරීම
(2) ජනතා කණ්ඩායම්වල අදහස් අනුව තීරණ ගැනීම
(3) මහජනතාවට පාලනයට සහභාගි වීමට අයිතියක් තිබීම
(4) අධ්‍යාපනයට හා සමාජ සුභසාධනයට ප්‍රමුඛත්වය ලැබීම

**2.** පාරිසරික අයිතිවාසිකම් සම්බන්ධ ගැටලුවක දී ක්‍රියාත්මක විය යුතු ප්‍රධාන ආයතනය කුමක් ද?
(1) පරිසර අමාත්‍යාංශය
(2) මධ්‍යම පරිසර අධිකාරිය
(3) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
(4) භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය

**3.** බහු සංස්කෘතික ජනසමාජයක අනාගත පුරවැසියන් තුළ සංහිඳියාව ඇති කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි එලදායීම ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමයි.
(2) විවිධ ජන කණ්ඩායම් මිශ්‍ර වූ පාසල් ඇති කිරීමයි.
(3) අන්‍ය භාෂාවන් ඉගෙනීමට උනන්දු කිරීමයි.
(4) සංස්කෘතික විවිධත්වයක් ඇති කිරීමයි.

**4.** දේශීය නීතිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අමතරව දැකිය හැකි වෙනත් නීති වර්ග දෙකකි,
(1) උඩරට නීතිය හා තේසවලාමෙයි නීතිය.
(2) අපරාධ නීතිය හා ජාත්‍යන්තර නීතිය.
(3) අපරාධ නීතිය හා සිවිල් නීතිය.
(4) සිවිල් නීතිය හා මුස්ලිම් නීතිය.

**5.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ඡන්දදායකයාගේ වගකීම සඳහන් ප්‍රකාශය තෝරන්න.
(1) ජාතිය ගොඩනැගීමට කැපවීමක් ඇති නායකයන් තෝරා ගැනීම
(2) නව අපේක්ෂකයන් නියෝජිතයන් ලෙස තෝරා ගැනීම
(3) පිළිගත් පරම්පරාවකින් පැවත එන නායකයන්ට ඡන්දය ලබා දීම
(4) බලයේ සිටින නායකයන්ට විරුද්ධ කණ්ඩායමක් තෝරා ගැනීම

**6.** කලාපීය සංවිධාන බිහිවීමට පදනම් වී ඇති ප්‍රධාන අරමුණු දෙක තෝරන්න.
(1) යුදමය අරමුණු හා වෙළෙඳ අරමුණු
(2) අධ්‍යාපන අරමුණු හා සුභසාධක අරමුණු
(3) යුදමය අරමුණු හා ආර්ථික සහයෝගිතා අරමුණු
(4) ආර්ථික අරමුණු හා සුභසාධක අරමුණු

**7.** ගැල්ටුන්ගේ ගැටුම් පිළිබඳ ආකෘතියට අනුව ආකල්ප යනුවෙන් හඳුන්වන්නේ ගැටුම නිර්මාණය වීමට බලපාන පාර්ශ්වකරුවන්ගේ,
(1) දේශපාලන සාධක වේ.
(2) සංස්කෘතික සාධක වේ.
(3) සමාජ විද්‍යාත්මක සාධක වේ.
(4) මනෝවිද්‍යාත්මක සාධක වේ.

[දෙවැනි පිටුව බලන්න.

**8.** ශ්‍රී ලාංකිකයන්ට දේශපාලනයට මැදිහත් වීමට වැඩි අවස්ථා ලබා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මින් කුමක් ද?
(1) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (2) මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
(3) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (4) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**9.** නිෂ්පාදන සාධක නිවැරදිව සඳහන් වරණය තෝරන්න.
(1) ශ්‍රමය, ප්‍රාග්ධනය, වැටුප, භූමිය (2) ව්‍යවසායකත්වය, පොලිය, ප්‍රාග්ධනය, ශ්‍රමය
(3) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (4) ප්‍රාග්ධනය, ලාභය, ශ්‍රමය, භූමිය.

**10.** විධායක හා පරිපාලන ක්‍රියා නිසා පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ සොයා බැලීමට පත් කර ඇති තනතුර කුමක් ද?
(1) ඔම්බුඩ්ස්මන් (2) අගවිනිසුරු (3) කථානායක (4) නීතිපති

**11.** කාන්තාවන්ට එරෙහිව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) යටතේ කාන්තාවන්ට හිමි අයිතීන්වලට අයත් **නොවන්නේ** පහත කුමක් ද?
(1) අධ්‍යාපනයට හා පුහුණුවට ඇති අයිතිය (2) සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය
(3) සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය (4) විවාහයට හා රැකියා කිරීමට ඇති අයිතිය

**12.** ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණ සඳහා වර්තමානයේ දී භාවිත කරන නියෝජන ක්‍රමය මින් කුමක් ද?
(1) සරල බහුතර (2) සමානුපාතික (3) සමාන්තර (4) දිස්ත්‍රික්

**13.** මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු වෙත පවරා දීම හැඳින්වෙන්නේ කුමන නාමයකින් ද?
(1) බලය බෙදා හැරීම (2) බලය මධ්‍යගත කිරීම
(3) බලය ව්‍යාප්ත කිරීම (4) බලය විමධ්‍යගත කිරීම

**14.** ජනසමාජයක "සංස්කෘතිය" යන්න පැහැදිලි කරන වගන්තිය තෝරන්න.
(1) පාරම්පරික විශ්වාස අනුව ජනසමාජයක ක්‍රියා කිරීම
(2) ආගමික විශ්වාස අනුව විවිධ ඇදහිලි අනුගමනය කිරීම
(3) සමාජය තුළ පිළිගත් ජීවන රටාවකට අනුව හැඩගැසීම
(4) විවිධ ජන වර්ගවලට අයත් පුද්ගලයන් එක්ව ජීවත් වීම

**15.** සන්ධීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) මධ්‍යම ආණ්ඩුවකින් පාලනය සිදු වීම (2) බලය විමධ්‍යගත කර තිබීම
(3) බලතල නැවත පවරා ගත හැකි වීම (4) උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පැවතීම

**16.** සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණපාන ගැටලු විසඳා ගැනීමට රටකට ගත හැකි වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) අපනයන විවිධාංගීකරණය දිරිගැන්වීමයි. (2) විදේශ ණය ආධාර සඳහා දිරිගැන්වීමයි.
(3) බුද්ධිගලනය දිරිගැන්වීමයි. (4) ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳපොළ දිරිගැන්වීමයි.

**17.** 1945 ජූනි 26 දිනය සමස්ත ලෝක ප්‍රජාවටම වැදගත් දිනයක් වීමට හේතුව කුමක් ද?
(1) දෙවන ලෝක සංග්‍රාමය අවසන් වීම (2) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත කර ගැනීම
(3) ළමා අයිතිවාසිකම් පනත සම්මත කර ගැනීම (4) මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය සම්මත කර ගැනීම

**18.** දේශපාලන අවබෝධයක් සහිත ජනතාවක් රටක සිටීම නිසා,
(1) පුද්ගල හැකියා දියුණු කර ගත හැකි ය.
(2) ආණ්ඩුවේ කටයුතු ගැන විවේචනය කළ හැකි ය.
(3) විරුද්ධ පක්ෂයේ ජනප්‍රියතාව වැඩි කළ හැකි ය.
(4) මහජනතාවට හිතකර ආණ්ඩුවක් පත් කර ගත හැකි ය.

**19.** දේශගුණික වෙනස් වීම් නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵලය කුමක් ද?
(1) උණුසුම් දියවැල් ක්‍රියාකාරී වීම (2) අම්ල වැසි ඇති වීම
(3) වර්ෂණ ක්‍රියාවලිය වෙනස් වීම (4) ධූමිකා නිර්මාණය වීම

**20.** අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි පමණක් සඳහන් පිළිතුර තෝරන්න.
(1) රාජ්‍ය විරෝධී ක්‍රියා, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ
(2) මිනීමැරුම්, ළමා අපචාර, දික්කසාද
(3) වාණිජ කටයුතු, මංකොල්ල කෑම්, ලිංගික අපරාධ
(4) ස්ත්‍රී දූෂණ, පොදු දේපළවලට හානි කිරීම, ඉඩම් ආරවුල්

[තුන්වැනි පිටුව බලන්න.

**21.** පාසලේ සාමාජිකයකු ලෙස ඔබෙන් ඉටු විය යුතු **වඩාත්ම** වැදගත් යුතුකමක් වන්නේ මින් කුමන යුතුකම ද?
(1) දිනපතා උදැසනම පාසලට පැමිණීම (2) පන්තියේ සිසුන්ට ඉගෙනීමට උදව් කිරීම
(3) අධ්‍යාපන කටයුතුවලට හොඳින් සහභාගි වීම (4) පාසලේ විනය නීති අනුගමනය කිරීම

**22.** ප්‍රජාතන්ත්‍රවාදී ජනසමාජයක රාජ්‍යයකින් ඉටු විය යුතු යුතුකමක් දැක්වෙන වගන්තිය තෝරන්න.
(1) සමාජ සිරිත් විරිත්වලට ගරු කරමින් ක්‍රියා කිරීම
(2) විධායකය සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම
(3) නියමිත කාලයට මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම
(4) නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම

**23.** සම්පත් විසංතුලනය යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) ලෝකයේ සම්පත්වල ව්‍යාප්තියේ අසමානතාවයි.
(2) ලෝකයේ සම්පත්වල පවතින හිඟතාවයි.
(3) සම්පත් තුලිත ලෙස ව්‍යාප්තව ඇති බවයි.
(4) සම්පත් එක තැනකට ඒකරාශී වී තිබෙන බවයි.

**24.** යහපාලනයක් සහිත රටක මූලික ගුණාංගයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම
(2) අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
(3) මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
(4) පෘදු ලබන ආයතන පෞද්ගලීකරණය කිරීම

**25.** 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඇති කළ ප්‍රධාන වෙනස්කමක් නම්,
(1) විධායක ජනාධිපති ධූරයක් ඇති කිරීමයි. (2) අග්‍රාණ්ඩුකාර තනතුර අහෝසි කිරීමයි.
(3) ශ්‍රී ලංකාව ස්වාධීන රාජ්‍යයක් කිරීමයි. (4) ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුව හඳුන්වා දීමයි.

**26.** අජෛව සංරචක යුගලයක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වායුගෝලය, ශාක (2) දේශගුණය, පස
(3) පාෂාණ, ක්ෂුද්‍ර ජීවීන් (4) දේශගුණය, ක්ෂුද්‍ර ජීවීන්

**27.** ගෝලීයකරණයට මුහුණදීම සඳහා සංවිධානය වී ඇති උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) සඳහා අයත් වන රටවල් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ඩෙන්මාර්කය, ඇමෙරිකා එක්සත් ජනපදය, ලක්සම්බර්ග්
(2) ඉන්දියාව, ස්පාඤ්ඤය, ඇමෙරිකා එක්සත් ජනපදය
(3) ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව
(4) ඇමෙරිකා එක්සත් ජනපදය, නෙදර්ලන්තය, ඉතාලිය

**28.** රටක නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ සිදු වන මූලික ක්‍රියාවලීන් ඇතුළත් වරණය තෝරන්න.
(1) නිෂ්පාදනය, මිල දී ගැනීම, පරිභෝජනය (2) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය
(3) නිෂ්පාදනය, ගබඩා කිරීම, පරිභෝජනය (4) නිෂ්පාදනය, ඇසිරීම, පරිභෝජනය

**29.** බටහිර රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය ලෙස නැගී සිටීමට හේතු වූ ප්‍රධාන සාධකයකි,
(1) සමාජ සුභසාධනය ඇති කිරීම. (2) වැඩවසම් ක්‍රමය පවත්වා ගැනීම.
(3) මානව හිමිකම් ආරක්ෂා කිරීම. (4) ජාතික ඒකාග්‍රතාව ඇති කිරීම.

**30.** ඒකීය ආණ්ඩුක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණයකි,
(1) උත්තරීතර මන්ත්‍රණ සභාවක් පැවතීම. (2) ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව සතු වීම.
(3) ව්‍යවස්ථාදායකය මගින් විධායකය තේරීම. (4) ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල හිමි වීම.

**31.** ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිත රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?
(1) පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම
(2) තොරතුරු දැනගැනීමේ අයිතිය හිමි වීම
(3) ජනතාවට ආණ්ඩුවට අදහස් ඉදිරිපත් කළ හැකි වීම
(4) ආර්ථික ප්‍රතිලාභ සැමට හිමි වීම

[හතරවැනි පිටුව බලන්න.

122200

**32.** මූලික අයිතිවාසිකම් යනුවෙන් හඳුන්වන්නේ,

(1) මිනිසුන්ට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු යැයි සැලකෙන අයිතිවාසිකම් ය.
(2) ජාත්‍යන්තර වශයෙන් සම්මුතීන් මගින් පිළිගෙන ඇති අයිතිවාසිකම් ය.
(3) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජනතාව සම්මත කරගෙන ඇති අයිතිවාසිකම් ය.
(4) මානව හිමිකම් අතුරෙන් රටක මූලික නීතියට ඇතුළත් කර ඇති අයිතිවාසිකම් ය.

**33.** පරිසරයෙන් ලැබෙන සේවා අතුරෙන් ජීව උපකාරක සේවා පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) භූමිය, පොසිල ඉන්ධන (2) හිරු එළිය, ජලය
(3) ජලය, භූමිය (4) පොසිල ඉන්ධන, හිරු එළිය

**34.** ගැටුම්කාරී චර්යා සහිත පුද්ගලයන් නිසා ඇති විය හැකි තත්ත්වයන් කිහිපයක් පහත දැක්වේ.

A - ක්ෂණික කෝපය නිතර ඇති වීම
B - මිතුරන් සමග නිතර ගැටුම් ඇති වීම
C - පුද්ගලයන් තුළ ආතතිය ඇති වීම
D - අසල්වාසීන් සමග ගැටුම් ඇති වීම

ඉහත තත්ත්ව අතුරෙන් සමාජීය තත්ත්වයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා C (2) B හා C (3) B හා D (4) A හා D

**35.** 'දේශ සීමා' නම් සාධකය පදනම් කරගෙන ගැටුම් නිර්මාණය වී ඇති රාජ්‍යයක් වන්නේ,

(1) අයර්ලන්තයයි. (2) ඊශ්‍රායලයයි. (3) සිරියාවයි. (4) රුවන්ඩාවයි.

**36.** ජාත්‍යන්තර සබඳතා වර්ධනයේ දී නූතනයේ දක්නට ලැබෙන ප්‍රවණතා ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) වෙළෙඳාම හා සංස්කෘතික සබඳතා (2) වෙළෙඳාම හා අධ්‍යාපනික සබඳතා
(3) සංස්කෘතික හා රාජ්‍යතාන්ත්‍රික සබඳතා (4) තාක්ෂණික හා අධ්‍යාපනික සබඳතා

**37.** පහත 'අ' තීරුවේ සඳහන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා 'ආ' තීරුවේ සඳහන් හඳුන්වා දෙන ලද වෙනස්කම් නිවැරදිව පිළිවෙළින් ගළපා ඇති පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සෝල්බරි (1947) | A - කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම |
| 2. පළමු ජනරජ (1972) | B - විධායක කාරක සභා පිහිටුවීම |
| 3. දෙවන ජනරජ (1978) | C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම |
| | D - ජනවර්ග අනුව නියෝජිතයන් පත් කිරීම |
| | E - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම |

(1) A, B, C (2) A, C, E (3) A, B, E (4) A, D, E

**38.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් **නිවැරදිව** දක්වා ඇති පිළිතුර කුමක් ද?

(1) පරිසර සංරක්ෂණය, මාර්ග ආරක්ෂාව, මහජන සෞඛ්‍ය
(2) පොදු උපයෝගිතා සේවා, වාහන බලපත්, බදු පැනවීම
(3) මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, මහජන සාමය
(4) පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා

**39.** නීතිපතිතුමාගේ බලතලවලට අයත් වන්නේ මින් කුමක් ද?

(1) අධිකරණය සම්බන්ධ රීති පැනවීමේ හා සංශෝධනය කිරීමේ බලය
(2) ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට විත්තිකරුවන් නිදහස් කිරීමේ බලය
(3) පාර්ලිමේන්තුවට විවිධ අණපනත් ඉදිරිපත් කිරීමේ බලය
(4) විවිධ අධිකරණ ආයතනවලට විනිසුරුවන් පත් කිරීමේ බලය

**40.** A හා B ප්‍රකාශ සලකා බලන්න.

A - මිනිසා සිය ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී ස්වභාවික සම්පත් හා ඛනිජ සම්පත් අසීමිත ලෙස භාවිත කර ඇත.
B - පරිසරයේ සමතුලිතතාව බිඳී යාම තුළින් පාරිසරික ගැටලු නිර්මාණය වේ.

මෙම ප්‍රකාශ අතුරෙන්

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර, B සත්‍ය වේ.
(3) A හා B දෙකම සත්‍ය වේ. (4) A හා B දෙකම අසත්‍ය වේ.

**

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**62 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) ග්‍රීසියේ පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පාලනයට සහභාගි වීමට අවස්ථාව හිමි නොවූ කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති අධිකරණ බලතල සහිත විශේෂ ආයතන **දෙකක්** නම් කරන්න.

(iii) ගැටුම් නිරාකරණයේ දී බේරුම් කිරීමේ විධි ක්‍රමය මගින් විසඳිය හැකි ගැටුම් වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(iv) රටක සමාජ සාධාරණත්වය බිඳවැටීම කෙරෙහි බලපාන හේතු **දෙකක්** දක්වන්න.

(v) රටක ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාම සඳහා පුරවැසියකු සතු යුතුකම් **දෙකක්** ලියන්න.

(vi) මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදාගනු ලබන සංරචක **දෙකක්** නම් කරන්න.

(vii) අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයේ සිදු වූ ඓතිහාසික අවස්ථා **දෙකක්** ලියන්න.

(viii) සන්ධීය ආණ්ඩුවක බල අධිකාරිය බෙදී ඇති ආයතන **දෙක** නම් කරන්න.

(ix) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.

(x) අන්තර්ජාතික වෙළෙඳාමේ ප්‍රධාන ස්වරූප **දෙක** ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** සමාජ සංවර්ධන ක්‍රියාවලියේ දී සාධනීය හා නිර්මාණාත්මක බලවේගයක් ලෙස ගැටුම් හැඳින්විය හැකි ය.

(i) අභ්‍යන්තර ගැටුම් අයත් වන ප්‍රධාන අංශ **දෙක** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුම් නිරාකරණයේ දී සාකච්ඡා ක්‍රමය මගින් ඇති වන වාසි **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)

(iii) (a) පන්ති කාමරය තුළ දී සිදු වන විවිධ ගැටුම්කාරී අවස්ථාවන්ට මුහුණදීම සඳහා ඔබ විසින් වර්ධනය කරගත යුතු ගුණාංග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එකක** වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

**3.** ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, ජනතාවගේ අදහස් හා සහභාගිත්වය සහිත ව ජනතාව උදෙසා ජනතාව විසින් පවත්වා ගෙන යනු ලබන පාලන ක්‍රමයකි.

(i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී ජනසමාජයක මාධ්‍ය විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** කාර්යභාරයක් විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

[හයවැනි පිටුව බලන්න.

**4.** සමාජයේ යහපැවැත්ම සඳහා නීතිය පිළිබඳ අවබෝධයෙන් යුතු වීම සෑම පුරවැසියකුගේ ම වගකීම වේ.

(i) සිවිල් නීතියේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) රටක නීතියේ ආධිපත්‍ය නොමැති වූ විට ඇති විය හැකි ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (a) නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා පුරවැසියකු ලෙස ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

**5.** සංස්කෘතික බහුවිධතාවෙන් යුතු සමාජ ක්‍රමයක් බහුසංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වනු ලබයි.

(i) බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව බහුසංස්කෘතික රටක් වීම කෙරෙහි බලපෑ සාධක **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (a) බහුසංස්කෘතික ජනසමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් වර්ධනය කර ගත යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** ගුණාංගයක් ප්‍රගුණ කිරීමෙන් සමාජයට ඇති වන යහපත විස්තර කරන්න. (ලකුණු 02 යි)

**6.** සමාජ ක්‍රම පොදුවේ මුහුණදෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

(i) ලෝකයේ දක්නට ලැබෙන අර්ථ ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අර්ථ ක්‍රම පොදුවේ මුහුණ දෙන ආර්ථික ප්‍රශ්න **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ අර්ථ ක්‍රමය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

**7.** මානව බලපෑම් මගින් පරිසරය විවිධ විපර්යාසවලට ගොදුරු වීම නිසා වර්තමානයේ පරිසරය පිළිබඳ දැඩි අවධානයක් යොමුව ඇත.

(i) වායු දූෂණය මගින් ජීවීන්ට සිදු විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) මිනිසා විසින් සිදු කරන වැරදි ක්‍රියා නිසා සමාජ පරිසරය තුළ ඇති වී තිබෙන අයහපත් තත්ත්වයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වර්තමානයේ දක්නට ලැබෙන පාරිසරික ගැටලු අවම කිරීමට පුරවැසියන්ට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කරන්න. (ලකුණු 03 යි)

(b) ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් ඔබේ නිවස ආශ්‍රිත ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 02 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය<br>பாட இலக்கம் | 62 | විෂයය<br>பாடம் | පුරවැසි අධ්‍යාපනය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 3 | 31. | 1 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 | 32. | 4 |
| 03. | 2 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 3 | 14. | 3 | 24. | 4 | 34. | 3 |
| 05. | 1 | 15. | 4 | 25. | 1 | 35. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 2 | 36. | 4 |
| 07. | 4 | 17. | 2 | 27. | 3 | 37. | 2 |
| 08. | 4 | 18. | 4 | 28. | 2 | 38. | 4 |
| 09. | 3 | 19. | 3 | 29. | 4 | 39. | 2 |
| 10. | 1 | 20. | 1 | 30. | 2 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

1. (i) ග්‍රීසියේ පැවති සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පාලනයට සහභාගි වීමට අවස්ථාව හිමි නොවූ කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.
(ii) විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති අධිකරණ බලතල සහිත විශේෂ ආයතන **දෙකක්** නම් කරන්න.
(iii) ගැටුම් නිරාකරණයේ දී බේරුම් කිරීමේ විධි ක්‍රමය මගින් විසඳිය හැකි ගැටුම් වර්ග **දෙකක්** සඳහන් කරන්න.
(iv) රටක සමාජ සාධාරණත්වය බිඳවැටීම කෙරෙහි බලපාන හේතු **දෙකක්** දක්වන්න.
(v) රටක ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාම සඳහා පුරවැසියකු සතු යුතුකම් **දෙකක්** ලියන්න.
(vi) මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදාගනු ලබන සංරචක **දෙකක්** නම් කරන්න.
(vii) අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයේ සිදු වූ ඓතිහාසික අවස්ථා **දෙකක්** ලියන්න.
(viii) සන්ධීය ආණ්ඩුවක බල අධිකාරිය බෙදී ඇති ආයතන **දෙක** නම් කරන්න.
(ix) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.
(x) අන්තර්ජාතික වෙළෙඳාමේ ප්‍රධාන ස්වරූප **දෙක** ලියන්න.

(i) නගරවැසි කාන්තාවන්, වහලුන්, විදේශිකයන් හෝ ඊට සමාන අදහස් දෙන ඕනෑම වචනයක්

(ii) කම්කරු විනිශ්චය සභාව, කාර්මික උසාවි, ගෙවල් කුලී මණ්ඩලය, සමථ මණ්ඩලය

(iii) කාර්මික ආරවුල්, සේවක වැටුප් හා අයිතිවාසිකම් ගැටුම්, සේවක ගැටුම්, විනය පරීක්ෂණ, මුදල් පිළිබඳ ආරවුල්

(iv)
- අනවශ්‍ය ආකාරයෙන් බලය විමධ්‍යගත කිරීම
- රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂමතාව
- රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම
- නිලධාරිවාදය
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමට හා ක්‍රියාවට නැංවීමට ජනතා සහභාගිත්වය නොමැති වීම
- අල්ලස හා දූෂණය ඉහළ යාම
- රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම
- පෞද්ගලික අංශය ජාතික අභිලාෂ නොතකා හැරීම
- විනිවිදභාවයෙන් තොරවීම
- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම / නඩු විසඳීම ප්‍රමාද වීම

*මේ හා සමාන වෙනත් පිළිතුරු සඳහා ද ලකුණු ලබා දෙන්න.*

(v)
- ඵලදායී ජීවන වෘත්තියක නියැළීම
- අල්ලස, දූෂණය නාස්තිය, වංචාව පිටුදැකීම
- නිදහස සාධාරණත්වය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ජාතික අභිමානය, ජාතික උරුමය රැක ගැනීමට සහ ආරක්ෂා කිරීමට දායක වීම
- දරුවන්ට, වැඩිහිටියන්ට, ආබාධිතයන්ට, රෝගීන්ට රැකවරණය, පෝෂණය සහ ආදරය ලබාදීම
- රජයේ සුභසාධන සේවා අයථා ලෙස පරිහරණයෙන් වැළකීම හා ඒවා ආරක්ෂා කිරීමට දායක වීම
- නීති ගරුකව ජීවත්වීම, නීතියට අනුකූලව කටයුතු කිරීම
- ජාතික ආරක්ෂාව සම්බන්ධ තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම
- වැරදි තොරතුරු ප්‍රචාරණය වළක්වා ගැනීම
- මාධ්‍ය අවභාවිතය වැළැක්වීම

*මෙවැනි පිළිතුරු දෙකක් සඳහා ලකුණු ලබාදෙන්න.*

(vi)
- උපතේදී ආයු අපේක්ෂාව
- අධ්‍යාපනය / සාක්ෂරතාවය
- ක්‍රය ශක්තිය මත ගැලපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය

(vii)
- මැග්නා කාර්ටා ගිවිසුම
- බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ඉංග්‍රීසි විප්ලවය / උත්කෘෂ්ට විප්ලවය

(viii)
- මධ්‍යම ආණ්ඩුව
- ප්‍රාන්ත ආණ්ඩු / ප්‍රාදේශීය ආණ්ඩු

(ix)
- විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
- වැඩ ලෝකය තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වීම
- දේශීය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇතිවීම
- කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම
- ජාත්‍යන්තර වෙළෙඳ පොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම
- ආර්ථිකය විවිධාංගිකරණය වීම
- දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම

*මෙවැනි සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.*

(x)
- ද්වි පාර්ශ්වික වෙළඳාම
- බහු පාර්ශ්වික වෙළඳාම

(ලකුණු **2 x 10 = 20** යි)

**2.** සමාජ සංවර්ධන ක්‍රියාවලියේ දී සාධනීය හා නිර්මාණාත්මක බලවේගයක් ලෙස ගැටුම් හැඳින්විය හැකි ය.

(i) අභ්‍යන්තර ගැටුම් අයත් වන ප්‍රධාන අංශ **දෙක** සඳහන් කරන්න.

(ii) ගැටුම් නිරාකරණයේ දී සාකච්ඡා ක්‍රමය මඟින් ඇති වන වාසි **තුනක්** පෙන්වා දෙන්න.

(iii) (a) පන්ති කාමරය තුළ දී සිදු වන විවිධ ගැටුම්කාරී අවස්ථාවන්ට මුහුණදීම සඳහා ඔබ විසින් වර්ධනය කරගත යුතු ගුණාංග **තුනක්** දක්වන්න.

(b) ඉන් **එකක** වැදගත්කම පැහැදිලි කරන්න.

(i)
- පුද්ගල ගැටුම් / සූක්ෂම ගැටුම්
- සමාජයීය ගැටුම් / සාර්ව ගැටුම්

(ලකුණු 02 යි)

(ii)
- සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමුවීම
- පෞද්ගලික හෝ විශ්වාසනීය මට්ටමින් සිදුවීම
- ක්ෂණික විසඳුම් ලැබීම
- වියදම් අවම ක්‍රමයක් වීම
- අවිධිමත් ව්‍යුහයකින් යුක්ත වීම
- දෙපාර්ශවයටම ජය ජය විසඳුම් ලැබීම
- කාලය ඉතිරි කරගත හැකි වීම

මෙවැනි කරුණු තුනක් සඳහා ලකුණු 03 යි

(iii)

(a)
- ඉවසීම
- කරුණාව හා මෛත්‍රී සහගත වීම
- සවන්දීම
- සංවේදී වීම
- ඵලදායි සන්නිවේදනය
- දරාගැනීමේ ශක්තිය
- ඵලදායි තීරණ ගැනීම
- චිත්තවේග සමබරතාව

**මීට සමාන පිළිතුරු සඳහාද ලකුණු ලබා දිය හැකිය. කරුණු 3 ක් නම් කිරීම සඳහා ලකුණු 03 යි**

(b) ශිෂ්‍යයා විසින් ප්‍රගුණ කරන ලද එක් ගුණාංගයක් පන්ති කාමරයේදී වැදගත් වන ආකාරය සාකච්ඡා කර තිබිය යුතුය. ඒ යටතේ පන්ති කාමරය තුළ සමගිය ඇති වීම, සුහදතාව වර්ධනය වීම, ගැටුම් අවම වීම වැනි කරුණු දෙකක්වත් විස්තර කර තිබීම අවශ්‍යය.

**(ලකුණු 02 යි)**

**3.** ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, ජනතාවගේ අදහස් හා සහභාගිත්වය සහිත ව ජනතාව උදෙසා ජනතාව විසින් පවත්වා ගෙන යනු ලබන පාලන ක්‍රමයකි.

(i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප **දෙකක්** දක්වන්න.

(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී ජනසමාජයක මාධ්‍ය විසින් ඉටු කළ යුතු කාර්යභාරයන් **තුනක්** සඳහන් කරන්න.

(b) ඉන් **එක්** කාර්යභාරයක් විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(i) බහු පක්ෂ, ද්වි පක්ෂ

**එක් කරුණකට එක් ලකුණ බැගින්**
**(ලකුණු 02 යි)**

(ii)
- නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්දදායකත්වය / ඡන්ද අපේක්ෂකත්වය ලැබීමේ අයිතිය තහවුරු වීම
- නිදහස් මැතිවරණ කටයුතුවලට සහභාගි වීමට ඇති අයිතිය තහවුරු වී තිබීම
- මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම
- සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම
- අන් අයගේ මැතිවරණ කටයුතුවලට බාධා නොකිරීම
- රාජ්‍ය දේපළ අනිසි ලෙස භාවිතයෙන් වැළකීම

**මෙවැනි පිළිතුරු සඳහා ලකුණු ලබාදිය හැකිය.**

**(ලකුණු 03 යි)**

(iii)

(a) • සත්‍ය හා නිවැරදි තොරතුරු මහජනතාවට ලබා දීම
- අපක්ෂපාතීව හා සමාජයේ යහපැවැත්මට හිතකර අන්දමින් තොරතුරු සැපයීම
- ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම
- පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීම
- ජනතාවගේ දැනුම වර්ධනය කිරීම
- කාලීන තොරතුරු නිසි වේලාවට ජනතාවට ලබා දීම
- ප්‍රදේශයේ අඩුපාඩු පිළිබඳ පාලක අවධානය යොමු කිරීම
- සමාජ අකටයුතුකම් අනාවරණය කිරීම

**මීට සමාන වෙනත් පිළිතුරු සඳහාද ලකුණු ලබාදිය හැකිය.**

(ලකුණු 03 යි)

(b) ඉහත සඳහන් කළ කාර්යයන්ගෙන් එකක් වර්තමානයේ ජනතාවට හිතකරව සිදුවේද නැද්ද යන්න පිළිබඳ විවේචන සහිතව විස්තර කළ යුතුය.

**තෝරාගත් කාරණය සිදුවන ආකාරය හා එහි හොඳ නරක ඇතුළත් වනසේ විස්තර කර තිබීම අවශ්‍යයි. ශිෂ්‍යයාගේ විවේචනාත්මක හැකියාව පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.**

(ලකුණු 02 යි)

**4.** සමාජයේ යහපැවැත්ම සඳහා නීතිය පිළිබඳ අවබෝධයෙන් යුතු වීම සෑම පුරවැසියකුගේ ම වගකීම වේ.

(i) සිවිල් නීතියේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) රටක නීතියේ ආධිපත්‍ය නොමැති වූ විට ඇති විය හැකි ප්‍රතිඵල **තුනක්** ලියන්න.

(iii) (a) නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා පුරවැසියකු ලෙස ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න.

(b) ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න.

(i) • පුද්ගලික පාර්ශවයන් අතර ඇතිවන ආරවුල් නිරාකරණය කරයි.
- ගිවිසුම්, ව්‍යාපාර, පවුල් වැනි ක්ෂේත්‍ර වලට අදාළ විවිධ ශාඛා දක්නට ලැබේ.
- සිවිල් වැරදි සම්බන්ධව වන්දි ගෙවීම දඩ ගැසීම වැනි දඬුවම් පමුණුවයි.
- හාන්පූරණය යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රමුඛතාව දෙයි.
- ආරවුලට සම්බන්ධ පුද්ගලික පාර්ශවයන් පැමිණිල්ල ඉදිරිපත් කරයි.
- සිවිල් නීති සම්බන්ධ සිවිල් නඩු විධාන සංග්‍රහය ප්‍රධාන වේ.

මෙවැනි ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි

(ii) • අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසය නොමැති වීම / බිඳ වැටීම
- මහජනතාව නීතිය සියතට ගැනීම
- නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම
- රටතුළ සිදුවන අපරාධ හා දූෂණ ඉහළ යාම
- රටතුළ නීතියේ සමානතාව හා සාධාරණත්වය බිඳ වැටීම
- යුක්තිය ඉටුකරගැනීමට විශාල කාලයක්, ශ්‍රමයක්, මුදලක් වැය වීම

- මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම
- පාලකයින්, රාජ්‍ය නිලධාරින් අත්තනෝමතිකව කටයුතු කිරීම
- නීති කඩකිරීම්වලට පෙළඹීම
- යුක්තිය පසිඳලීම ප්‍රමාද වීම
- අධිකරණ තීන්දු පිළිබඳ විශ්වාසය නොමැති වීම
- විනිශ්චයකාරවරුන්ට බලපෑම් සිදු වීම

**මෙවැනි කරුණු තුනක් සඳහා ලකුණු ලබා දෙන්න.**

**මෙම කරුණු හෝ වෙනත් සමාන අදහස් සහිත පිළිතුරු තුනකට ලකුණු ලබාදිය හැකිය.**

(ලකුණු 03 යි)

(iii)

(a)

- නීතියට අනුව කටයුතු කිරීම
- නීතිය පිළිබඳව අවබෝධයෙන් යුතු වීම
- අන් අයට හානියක් නොවන ආකාරයට ජීවත් වීම
- මානව හිමිකම් ආරක්ෂා වන සේ කටයුතු කිරීම
- අධිකරණ ක්‍රියාදාමයන්ට බාධා නොකිරීම
- නීතිය අනුව විසඳුමක් ලැබෙන තුරු බලා සිටීම
- අවනීතිය ක්‍රියාත්මක නොකිරීම
- සියලු දෙනාට සමානව හා සාධාරණව සැලකීම
- රැකියාව ධනය වැනි සාධක මත අන් අයට බලපෑම් නොකිරීම
- පාලකයින්, නිලධාරින් අත්තනෝමතික ලෙස කටයුතු කිරීමෙන් වැළකීම

**මෙම කරුණු හෝ මෙවැනි සමාන අදහස් ඇති කරුණු සඳහාද ලකුණු ලබාදිය හැකිය.**

(ලකුණු 03 යි)

(b) නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කරගැනීම සඳහා පුරවැසියකුට අනුගමනය කළ හැකි එක් ක්‍රියාමාර්ගයක් විස්තර කර තිබීම අවශ්‍යය.

පුද්ගලයන්ට සමානව සැලකීම, සාධාරණය ඉටුවීම, ගැටලු අවම වීම වැනි වාසි ඇතිවන සේ ඉහත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ හැකි ආකාරය විස්තර කර තිබීම අවශ්‍යය.

(ලකුණු 02 යි)

**5.** සංස්කෘතික බහුවිධතාවෙන් යුතු සමාජ ක්‍රමයක් බහුසංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වනු ලබයි.

(i) බහුසංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාව බහුසංස්කෘතික රටක් වීම කෙරෙහි බලපෑ සාධක **තුනක්** දක්වන්න.

(iii) (a) බහුසංස්කෘතික ජනසමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් වර්ධනය කර ගත යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න.

(b) ඉන් **එක්** ගුණාංගයක් ප්‍රගුණ කිරීමෙන් සමාජයට ඇති වන යහපත විස්තර කරන්න.

(i)
- විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාසය දරණ, විවිධ භාෂා කථා කරන පුද්ගලයින් එකට ජීවත් වීම.
- ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත්, විරිත්, ආචාරධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.
- එක ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයක් තිබේ.
- ලෝකයේ රටවල් දේශසීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් හා සම්මිශ්‍රව ජීවත්වීම.
- ගෝලීයකරණය, සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව හා සංචාරක ව්‍යාපාරය නිසා සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීම.

**මෙවැනි ඕනෑම ලක්‍ෂණ දෙකක් සඳහා ලකුණු 02 යි.**

(ii)
- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- වෙළඳාම සඳහා පැමිණීම
- ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම
- අන්තර් විවාහ සම්බන්ධතා ඇතිවීම
- ගෝලීයකරණය

**ඉහත අංග යටතේ දක්වා ඇති කරුණු සඳහාද ලකුණු දිය හැකිය.**

(ලකුණු 03 යි)

(iii)

(a)
- එකිනෙකාගේ සංස්කෘතීන් හඳුනාගැනීම හා අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීම, එකිනෙකාට ගරු කිරීම.
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- සාමූහිකත්වය වර්ධනය කිරීම.
- එක්සත්ව කටයුතු කිරීමෙන් ජයග්‍රහණ ලබා ගැනීම හැකි බව අවබෝධ කර ගැනීම.
- අනෙකුත් ජනවර්ගවල භාෂාවන් ඉගෙනීම හා භාවිතය.
- සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම.
- සමානාත්මතාවය.

**මෙවැනි කරුණු තුනක් සඳහන් කිරීමට ලකුණු ලබා දෙන්න.**

(b) බහු සංස්කෘතික සමාජයක පුරවැසියන් විසින් ප්‍රගුණ කළ යුතු යැයි ඉහත දක්වා ඇති ගුණාංගයක් නිසා සමාජයට සිදුවන යහපත් තත්ත්වයක් දෙකක්වත් විස්තර කර තිබීම අවශ්‍යය. එම විස්තරය තුළ සමාජය තුළ ගැටුම් අවම වීම, ජාතීන් අතර සහයෝගය වර්ධනය වීම, සංස්කෘතික සම්ප්‍රේෂණය සිදුවීම, රටක් ලෙස සාමූහිකව ඉදිරියට යාහැකි වීම වැනි යහපත් තත්ත්වයක් තිබිය යුතුය.

**(ලකුණු 02 යි)**

**6.** සමාජ ක්‍රම පොදුවේ මුහුණදෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ.

(i) ලෝකයේ දක්නට ලැබෙන අර්ථ ක්‍රම **දෙකක්** නම් කරන්න.

(ii) අර්ථ ක්‍රම පොදුවේ මුහුණ දෙන ආර්ථික ප්‍රශ්න **තුන** සඳහන් කරන්න.

(iii) (a) ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ අර්ථ ක්‍රමය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** නම් කරන්න.

(b) ඉන් **එක්** ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න.

(i)
- ධනවාදී අර්ථ ක්‍රම
- සමාජවාදී අර්ථ ක්‍රම
- මිශ්‍ර අර්ථ ක්‍රම

**මින් කරුණු දෙකකට ලකුණු 02 යි.**

(ii)
- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

**මෙම ප්‍රශ්න සඳහා වෙනත් සමාන අදහස් සහිත පිළිතුරකටද ලකුණු දිය හැකිය.**

**(ලකුණු 03 යි)**

(iii)

(a)
- පෞද්ගලික ආයෝජකයන්ට විවිධ බදු සහන ලබා දීම.
- වෙළෙඳ බාධා (තීරුබදු) අඩු කිරීම.
- වෙළෙඳපොලට රාජ්‍ය මැදිහත්වීම අඩු කිරීම.
- විදේශ ආයෝජන දිරි ගැන්වීම.
- රාජ්‍ය දේපළ පෞද්ගලිකකරණය කිරීම.
- විනිමය අනුපාතිකය පාවීමට ඉඩ හැරීම.
- ආනයන අපනයන ආර්ථිකයක් හඳුන්වා දීම.
- රාජ්‍ය ආයතන තරගකාරී වෙළෙඳපොලට විවෘත කිරීම.
- යටිතල පහසුකම් පුළුල් කිරීම.
- නිදහස් වෙළෙඳ කලාප පිහිටුවීම.

**මෙම කරුණු හෝ මීට සමාන අදහසක් දක්වෙන වෙනත් පිළිතුරු සඳහාද ලකුණු ලබාදිය හැකිය.**

**(ලකුණු 03 යි)**

(b) ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ අර්ථ ක්‍රමයේ දක්නට ලැබෙන ඉහත එක් ලක්ෂණයක් විස්තරකර තිබීම අවශ්‍ය වේ. එම විස්තරය තුළ තෝරාගත් ලක්ෂණයේ ස්වභාවය විස්තර කර තිබීම අවශ්‍යයයි.

(ලකුණු 02 යි)

**7.** මානව බලපෑම් මගින් පරිසරය විවිධ විපර්යාසවලට ගොදුරු වීම නිසා වර්තමානයේ පරිසරය පිළිබඳ දැඩි අවධානයක් යොමුව ඇත.

(i) වායු දූෂණය මගින් ජීවීන්ට සිදු විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** දක්වන්න.

(ii) මිනිසා විසින් සිදු කරන වැරදි ක්‍රියා නිසා සමාජ පරිසරය තුළ ඇති වී තිබෙන අයහපත් තත්ත්වයන් **තුනක්** සඳහන් කරන්න.

(iii) (a) වර්තමානයේ දක්නට ලැබෙන පාරිසරික ගැටලු අවම කිරීමට පුරවැසියන්ට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කරන්න.

(b) ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් ඔබේ නිවස ආශ්‍රිත ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය විස්තර කරන්න.

(i)
- ජෛව විවිධත්වය විනාශ වී යාම
- ජෛව නිෂ්පාදන ක්‍රියාවලිය විනාශ වීම
- ලෙඩ රෝග හා වසංගත ව්‍යාප්ත කිරීම

**මෙවැනි කරුණු දෙකක් සඳහා ලකුණු ලබා දිය හැක. ලෙඩ රෝග වැනි කරුණු යටතේ රෝග පමණක් දක්වා තිබේ නම් එක් ලකුණක් පමණක් දෙන්න.**

(ලකුණු 02 යි)

(ii)
- භූමිකා ගැටුම්
- කාර්ය බද්ධ පරිසරයේ ගැටුම්
- සමාජ හා සංස්කෘතික පරිහානිය
- පවුල් සංස්ථා බිඳ වැටීම
- පවුලේ කාර්යභාරය සංකීර්ණ වීම
- සමාජ ආයතනවල කාර්යභාරය පිරිහීම
- සමාජ සබඳතා බිඳවැටීම
- ආගමික හා වාර්ගික ගැටුම් ඇති වීම
- සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම
- සියදිවි හානි කරගැනීම
- මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම

**මෙම පිළිතුරුවලට සමාන අදහස්ද සිසුන් ඉදිරිපත් කළ හැකි බැවින් එම පිළිතුරු ද සලකා බැලිය හැකිය.**

(ලකුණු 03 යි)

(iii)

(a) පාරිසරික ගැටළු අවම කිරීමට පුරවැසියාට ගතහැකි ක්‍රියාමාර්ග

- නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම
- පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය
- රුක් රෝපණය, වන වැස්ම වැඩි කිරීම
- පරිසරයේ පැවැත්ම හා වැදගත්කම වටහාගෙන ක්‍රියා කිරීම
- පරිසරයට අදාළ නීති රීතිවලට අවනතව කටයුතු කිරීම
- පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- පරිසර අලංකරණය
- පරිසර හිතකාමී ද්‍රව්‍ය පරිහරණය
- පරිසරය සුරැකීම පිළිබඳ අන් පුද්ගලයන් දැනුවත් කිරීම

**මෙවැනි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කිරීම**

(ලකුණු 03 යි)

(b) ඉහත සඳහන් එක් ක්‍රියාමාර්ගයක් නිවස තුළදී ක්‍රියාවට නංවන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබීම අවශ්‍යයි. උදා - අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ගත් විට නිවස තුළම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා කොම්පෝස්ට් සෑදීම, සත්ත්ව ආහාර ලෙස භාවිත කිරීම වැනි හේතු දැක්විය හැකිය.

(ලකුණු 02 යි)

EXAMRESULTS.LK